කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2020

බුද්ධිමය දේපල නීතිය

පැ තුනයි (03)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කෙරේ)

---

**01.** ශ්‍රී ලංකාවේ ප්‍රකාශන අයිතිවාසිකම් නීතිය පදනම් කරගනිමින්, පහත දැක්වෙන එක් එක් අවස්ථාවේදී පැන නගින නෛතික ගැටළු පිළිබඳව පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

**(අ)** "කොරෝනා වෛරසයෙන් පසු ජීවිතය : සෞඛ්‍ය සම්පන්නව සිටින්නේ කෙසේද?" යන මාතෘකාව යටතේ වෛද්‍ය කුමාර ග්‍රන්ථයක් රචනා කරයි. ඔහු එය 2020 අගෝස්තුවේ ප්‍රකාශයට පත් කරයි. ප්‍රියා නම් වූ යෝග උපදේශිකාවක් විසින් රචිත "වසංගතයකට පසුව සෞඛ්‍ය සම්පන්නව වාසය කිරීමට ප්‍රයෝගික ක්‍රමවේදයන්" නම් වූ තවත් ග්‍රන්ථයක් වෙළඳපොළ තුළ පවතින බැවින් 2020 සැප්තැම්බර් මාසය තුළ ග්‍රන්ථයේ අලෙවියන් පහළ මට්ටමක පවතින බව කුමාර තේරුම් ගනී. ඔහුගේ ග්‍රන්ථයෙන් සෘජුවම ගන්න ලද ඡේද කිහිපයක්ම ග්‍රන්ථය කියවීමේදී ඔහු සොයා ගනී. එම ඡේදයන් කොරෝන වෛරසය පිළිබඳව වන සියළුම ප්‍රධාන වෙබ් අඩවි වලින් ලබාගත හැකි බවත් ඇයගේ ග්‍රන්ථයෙහි ලිඛිත පාඨයන්ට අමතරව යෝග ඉරියව්වල පින්තූර රාශියක් අන්තර්ගත හෙයින් එය සපුරාම වෙනස් එකක් බවත් ඔහු අභියෝගාත්මකව ප්‍රශ්නකල විට ප්‍රියා පිළිතුරු වශයෙන් පවසයි.

**(ආ)** ඇය වෙනුවෙන් විශේෂයෙන්ම ලියන ලද "නැගිටිමු අපි " ගීතය පටිගත කිරීමක් සඳහා සඳ TV විසින් ගායිකාවක් වන ආශානිගෙන් ඉල්ලා සිටියි. ඇයගේ නර්තන රචකයා විසින් නිර්මාණය කරන ලද නර්ථන පෙළක් සමගින් ඇය මෙම පටිගත කිරීම සිදු කරයි. පසුව සඳ TV විසින් එම ගීතය වෙනත් ගායකයින් කිහිපදෙනෙකු ලවා ගායනා කරවාගෙන නළු නිමැවුම කොපි කරමින් එම විකල්ප පිටපත් ඇයගේ ගීතය වෙනුවට දැන් විසුරුවා හරියි.

**(ඇ)** ජයාරූප ශිල්පියෙක් වන රමේෂ්, සමන් ස්ටුඩියෝහි පෙර සේවය කරන ලදී. ස්වාධීන ජායාරූප ශිල්පියෙකු ලෙස කටයුතු කිරීමට දැන් ඔහු අපේක්ෂා කරයි. සමන් ස්ටුඩියෝහි සේවය කරමින් සිටින විට ඔහු ගන්න ලද පින්තූර ඔහු නිර්මාණය කරන වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරයි. මෙම පින්තූර මගින් තම නිර්මාණයන්හි ගුණාත්මක භාවය හැගවීම සඳහා පමණක් යොදා ගන්නා බවත් ඒවා ඔහු සමන් ස්ටුඩියෝහි සේවය කරන අතර ගන්න ලද බවත් දක්වමින් තිරයේ පහළ කොටසේ අයිතිය අත්හැරීමේ ප්‍රකාශයක් ඇල කරයි.

(ලකුණු 25)

**02**. මෙම අභියෝගාත්මක කාලයෙහි ස්වයං පාලක රියපැදවීමේ තාක්ෂණ ශිල්පයන් වෙත පවතින වැඩිවන ඉල්ලුම මතින් උද්යෝගිමත් වූ තරුණ නව නිපැයුම්කරුවෙක් සහ මෝටර් රථ ඉංජිනේරුවෙක් වන රෝයි, විෂබීජහරණය, භාණ්ඩ බෙදාහැරීම සහ ප්‍රවාහනය සඳහා උපකාරී කරගත හැකි ස්වයං - ධාවක රොබෝ - ටැක්සියක මුල් ආකෘතියක් දියුණු කරයි. නව කොරෝනා වෛරසය තවත් අවම වශයෙන් වසර කිහිපයක්වත් ව්‍යාප්තව පැවතීමේ හැකියාව පිළිබඳ කරුණ සැලකිල්ලට ගනිමින් ගෝලීය ප්‍රජාව මුහුණපා සිටින කොවිඩ් - 19 හා සබැදුණු ගැටළු වලට ප්‍රතිචාරයක් ලෙස ඔහු නව්‍ය විසඳුමක් ගවේෂණය කිරීම තුළින් මෙම බුද්ධිමත් වාහනය දියුණු කරනු ලබයි. ස්වයං විෂබීජහරණය කර ගැනීමේ හැකියාවන් සහිත රොබෝ - ටැක්සිය මගින්, එය වාණිජමය වශයෙන් මහජනතාවට ලබා ගත හැකි වන විට එමගින් බොහෝ ජීවිත බේරා ගැනීමට හැකිවන බව රෝයි විශ්වාස කරයි. නැගී එන සමාගම් කිහිපයක්ම මෙම නව නිපැයුම කෙරෙහි දැඩි

උනන්දුවක් පෙන්වා ඇති බැවින්, මෙම ස්වයං - ධාවක රොබෝ - ටැක්සියට ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි පේටන් ආරක්ෂාව ලබා ගැනීමට රෝයි දැන් අපේක්ෂාවෙන් සිටියි.

ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය තුළ ඔහුට මුහුණ දීමට සිදුවිය හැකි නෛතික බාධාවන් සහ ශ්‍රී ලංකාව තුළ ඔහුගේ නව නිපැයුම සඳහා පේටන් බලපත්‍ර ලබාගැනීමේ හැකියාව පිළිබඳව රෝයිට උපදෙස් දෙන්න. අනෙකුත් අධිකරණ ක්ෂේත්‍රයන් තුළ පේටන් ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා වඩාත්ම සුදුසු ක්‍රමවේදය පිළිබඳව ඔහුව දැනුවත් කිරීමද ඔබගෙන් අපේක්ෂා කෙරේ. ඔබගේ උපදේශනය තහවුරු කිරීම සඳහා අදාළ නෛතික ප්‍රතිපාදන හා නඩු තීරණ නීතිය ඇසුරුකරගන්න

(ලකුණු 25)

**03.** ඔබ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලයට අනුබද්ධ වෙළඳ ලකුණු පරීක්ෂකවරයෙක් යයි උපකල්පනය කරන්න. ඔබගේ කාර්යාලයට ලැබී ඇති පහත දැක්වෙන අයදුම්පත්‍ර වල ලියාපදිංචි කිරීමේ හැකියාව පිළිබඳව ඔබගේ සහේතුක මතය ඉදිරිපත් කරන්න.

**(අ)** දෙහි ගසක්, සූර්යයා, අහස සහ වත්තක පින්තූරයකින් සමන්විත වන "සුපර් ලයිම් කෝඩියල්" යන වචන සහිත දෙහි කෝඩියල් අලෙවි කිරීම සඳහා වන ලකුණක්. දෙහි ගසක්, දේදුන්නක් සහ අහස සහිත දිය ඇල්ලක පින්තූරයක් ඇතුළත් "සුපර් ලයිම් ක්‍රෂ්" යන වචන සහිත දෙහි රසැති සිරි සිරි හඬ නගන පානයක් අලෙවි කිරීම සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති වෙළඳ ලකුණක් පවතී.

**(ආ)** "රුහුණු මීකිරි" වචන සහිත ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ කිරි නිෂ්පාදකයෙක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද ලකුණක්.

**(ඇ)** පොල්තෙල් වර්ගයක් අලෙවි කිරීම සඳහා "සිසිල් - තෙරපුමකින්, අතින් සාදන ලද මධුගේ පොල්තෙල්" යන වචන වලින් සමන්විත ලකුණක්. යන්ත්‍රයක් භාවිත කරමින් තෙල් සාදනු ලැබුවේ නම් ඔබගේ මතය වෙනස් වන්නේද?

**(ඇ)** අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහන් අලෙවිය සඳහා "ETV" නමින් රූපවාහිනී නාලිකාවක් සඳහා වන ලකුණක්. විනෝදාත්මක රූපවාහිනියක් අලෙවිකරණය සඳහා යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය පුරාම භාවිත වෙමින් පවතිනා සුප්‍රකට ලියාපදිංචි නොකරන ලද සමාන ලකුණක් පවතී.

(ලකුණු 25)

**04.** කූට නිදේශනය (Passing off) යන තෝරතය ආවරණය කරන වපසරියේ වැඩි ප්‍රමාණයක් බොහෝ අධිකරණ ක්ෂේත්‍රයන්හි අසාධාරණ තරඟය පිලිබඳ නීතිය නමැති සාමාන්‍ය ප්‍රදේශය තුළට වැටෙතැයි සලකනු ලබයි. කෙසේනමුත්, එමගින් 'අයුතු ධනවත්වීම' (unjust enrichment) ට ප්‍රතිකර්මයක් අන්තර්ගත නොවේ.

උක්ත ප්‍රකාශය ඇසුරෙන්, ශ්‍රී ලංකාවේ අසාධාරණ තරඟයට එරෙහි ආරක්ෂාව පිලිබඳ නීතිය සහ කූට නිදේශනය පිලිබඳ නඩුකරය පිළිබඳව විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ නෛතික ප්‍රතිපාදන සහ නඩු තීරණ නීතිය මගින් තහවුරු කරන්න.

(ලකුණු 25)

**05.** "ශ්‍රී ලංකාව තුළ වෙළඳ රහස් සඳහා නීතිමය ආරක්ෂාව: අපේක්ෂාවන්, අභියෝග සහ ඉදිරියට ගමන් කල යුතු මාවත" යන මැයෙන් ලෝක බුද්ධිමය දේපළ ඇකඩමිය විසින් සංවිධානය කරන ලද වෙබ් සම්මන්ත්‍රණය (webinar) ආමන්ත්‍රණය කිරීම සඳහා ඔබ වෙත ඇරයුම් කර ඇතැයි උපකල්පනය කරන්න. වෙළඳ රහස් ආරක්ෂා කරන විෂය පථය, වර්තමාන ශ්‍රී ලංකාවෙ නීති තත්වය සහ එහි අන්තර්ජාතික බැඳීම්, සියළු ප්‍රමාණයේ ව්‍යාපාරයන් සඳහා වෙළඳ රහස් ආරක්ෂා කිරීමේ වටිනාකම සහ නෛතික ප්‍රතිසංස්කරණයන් කිසිවක් වේ නම් ඒවාද මෙම ඉදිරිපත් කිරීම තුළ විශේෂයෙන් අවධානයට යොමු විය යුතුය. ඔබගේ ඉදිරිපත් කිරීම කෙටුම්පත් කරන්න.

(ලකුණු 25)

**06** පහත දැක්වෙන <u>ඕනෑම එකකට</u> පිළිතුරු සපයන්න.

<u>**එක්කෝ**</u>

(අ) ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම හා සබැඳුනු දේපළ අයිතිවාසිකම් ගිවිසුමෙහි බැඳීම් බොහෝ අවස්ථාවන්හිදී අනෙකුත් අන්තර්ජාතික ගිවිසුම් සහ සම්මුතීන් තරම් භාරදූර නොවේ. කෙසේනමුත්, ඒවා විශේෂයෙන්ම දියුණු වන රටවලට බාධාවක් ඇති කර තිබේ. මෙය සිදුවී ඇති ආකාරයත්, සහ තම බැඳීයාවන් ආරක්ෂා කර ගැනීමට දියුණු වෙමින් පවතින ජාතීන්ට කවර විකල්පයක් ඉතිරිවී පවතීද යන්න සුදුසු නිදසුන් සමගින් සාකච්ජා කරන්න.

<u>**නැතහොත්**</u>

(ආ) ප්‍රකාශන අයිතිවාසිකම් නීතියේ කොටසක් ලෙස පැවත, විදග්ධ වෙළඳපොළකට අවශ්‍ය සුවිශේෂී හා අනන්‍ය ආකාරයෙන් කාර්මික සැලසුම් පිලිබඳ නීතිය වර්ධනය වී ඇත. කාර්මික සැලසුම් පිලිබඳ නීතියෙහි ප්‍රධාන ලක්ෂණයන් විශ්ලේෂණය කරමින් එමගින් ආරක්ෂා කිරීමට අපේක්ෂා කරනු ලබන බුද්ධිමය දේපළ වර්ගයන්ට එහි ප්‍රයෝජනවත් භාවය අගයන්න.

(ලකුණු 25)

**(07)** ශ්‍රී ලංකාව තුළ වර්තමානයේදී ආරක්ෂා කරනු ලබන භූගෝලීය දර්ශක සංඛ්‍යාව අතිශයින්ම අවම වීම ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශක පිලිබඳ නීතිය හා සම්බන්ධ වූ ගැටළු වල ප්‍රතිඵලයකි. මෙම ප්‍රශ්න වලට හේතු හඳුනාගනිමින් සහ මේ ක්ෂේත්‍රයේ නීතිය කෙබඳු ආකාරයෙන් වෙනස් කළ යුතුද යන්න පිළිබඳව නිර්දේශයන් සහ එසේ කළ යුත්තේ මන්ද යන්න වර්තමාන ආරක්ෂණ පද්ධතිය විශ්ලේෂණය කිරීමෙන් ඉදිරිපත් කරන්න.

(ලකුණු 25)